# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 288 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2024

දිනය / திக / Date: 17/02/2024 පැය 2240

## මාධ්‍ය නිවේදනය

**මත්ද්‍රව්‍ය ජාවාරමට සම්බන්ධ සැකකරුවෙකු හෙරොයින් සමඟ අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය.**

2024.02.16 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා රාජගිරිය කඳවුරේ නිලධාරීන් හා පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශයේ නිලධාරීන්ට මත්ද්‍රව්‍ය ජාවාරම හා සම්බන්ධ පුද්ගලයින් දෙදෙනෙකු කාර් රථයකින් ගමන් කරන බවට ලද තොරතුරක් මත වැල්ලවත්ත පොලිස් වසමේ හැව්ලොක් සිටි ප්‍රදේශයේදී ඔවුන් ගමන් කළ රථය නවතා පරීක්ෂා කිරීමට සුදානම් වූ අවස්ථාවේදී රථය නැවත පණගන්වා පොලිස් නිලධාරියෙකුද අනතුරට ලක් කර පලා ගොස් ඇත.

පලා ගිය කාර් රථය පසුපස හඹා ගිය නිලධාරීන් විසින් එහි ගමන් කළ එක් පුද්ගලයෙකු අත්අඩංගුවට ගෙන ඇති අතර එහි සිටි අනෙක් පුද්ගලයා පලා ගොස් ඇත. අත්අඩංගුවට ගත් සැකකරු පරීක්ෂා කිරීමේදී ඔහු සන්තකයේ තිබූ ජංගම දුරකථනයක්, කාර් රථ 03 කට අයත් ස්විච් යතුරු 03 ක් තිබී හමු වී ඇත. පලා ගිය පුද්ගලයා සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශන සිදුකිරීමේදී ඔහු හැව්ලොක් නිවාස සංකීර්ණයේ නිවසක රැදී සිටින බවත්, ඔහු සතුව ස්විච් යතුරු වලට අදාල කාර් රථ නිවස සංකීර්ණය තුළ නවතා ඇති බවත් අනාවරණය කරගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42 ක් වූ කුඩා බුත්ගමුව, අංගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

සොයා ගන්නා ලද යතුරුවලට අදාල කාර් රථ පරීක්ෂා කිරීමේදී, නිලධාරියෙකු අනතුරට පත් කර පලා ගිය කාර් රථය එම සංකීර්ණයේ තිබී ඇති අතර එම රථයේ පරීක්ෂා කිරීමේදී තිබී හෙරොයින් අඩංගු පාර්සලයක්, ලැප්ටොප් පරිගණක යන්ත්‍රයක් හා මුදල් පසුම්බියක් සොයාගෙන ඇත. මුදල් පසුම්බිය පරීක්ෂා කිරීමේදී, පලාගිය සැකකරුට අයත් ජාතික හැඳුනුම්පත හා රියදුරු බලපත්‍රයක්ද පොලිසිය විසින් සොයා ගෙන ඇත. සැකකරුගෙන් තවදුරටත් ප්‍රශ්න කිරීමේදී, සැකකරුට අයත් කාර් රථයද, පොලිසිය විසින් සොයාගෙන ඇත.

සැකකරුගේ පෙන්වාදීම මත ඔවුන් රැඳී සිටි නිවසේ  පරීක්ෂා කිරීමේදී නිවසේ තිබී මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයාගත් බවට සැක කරන 103,500/- ක් ඇමරිකානු ඩොලර් 975 ක්, රන් තැලි 01 ක්, රන් වළලු 12 ක්, කරාබු ජෝඩුවක්, පෙන්ඩන් 03 ක්, රන් මුදු 05 ක්, රන් මාලයක්, බ්‍රේස්ලට් 01 ක්, රන් පැහැති ඔරලෝසු 04 ක්, රිදී පැහැති කරාබු ජෝඩුවක්, රිදී පැහැති අත් ඔරලෝසු 07 ක්, විවිධ වර්ගයේ අත් ඔරලෝසු 08 ක් හා පලා ගිය සැකකරුගේ ගුවන් ගමන් බලපත්‍රය, ජංගම දුරකථන 03 ක්, ලැප්ටොප් පරිගණක යන්ත්‍ර 02 ක් හා මැණික් ගල් බවට සැක කරන ගල් කැබලි 16 ක් අත්අඩංගුවට ගෙන ඇත.

පලාගිය සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**